සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II,III | කාලය / காலம் / Time: පැය 03 |

**11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

(01) (i) (අ) පබාවතී / කුසරාජ බිසව
(ආ) බෝධිසත්වයින් හෙවත් කුසරජු වසුන් කද ගෙනෙන අවස්ථාවේ බැණ නොනැගුනොත් මෙහි වාසය දිගටම සිදුවේ එය නවතාලන අදහසින් පබාවතී මෙසේ සිතීම ඇය ඔහුට බැණ ආපසු යැවීමට සිතූ අවස්ථාව.
2 x 2 = 4

(ii) (අ) උත්ප්‍රේක්ෂාලංකාරය
(ආ) සිරිගුණසිංහ මහතා 2 x 2 = 4

(iii) (අ) රාහුල කුමරු / යශෝධරා පුතු
(ආ) සදම්රත්නාවලිය 2 x 2 = 4

(iii) (අ) මහගමසේකර මහතා
(ආ) ප්‍රබුද්ධ පද්‍ය සංග්‍රහය 2 x 2 = 4

(iv) (අ) ප්‍රභූ ජනයා / උසස් මිනිසුන්
(ආ) ඊශ්වරයාගේ බෙල්ලේ
(ආ) සීතාවක යුගය 2 x 2 =4

(ලකුණු 20)

(02) (i) අත්දැකීම
උතුරේ දකුණේ ජීවත්වන මිනිසුන් බෙදී නොසිටිය යුතු බව, මොවුන් අතර ඇති භේදය විනාශ වී සියලු දෙනා එක්විය යුතු බව කියා පරිසරය ඇසුරින් ලද අත්දැකීම් ඇසුරින් කවිය නිර්මාණය කර ඇත.

(ii) කාව්‍යෝක්ති
ධ්වනිතාර්ථ - ඇඟවීමට
දකුණේ මෙන්ම උතුරෙත් හැම තැනම සිටී

ව්‍යංග්‍යාර්ථ - බැඳ ඇති විලංගුව පාමිණි සලඹ කොට....
උගතිමි කිමද මිනිසා සතු දෙනෙත තෙත....

චිත්ත රූප - නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට

සංකේත - පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ
මෙම කාව්‍යෝක්ති අත්දැකීම රසවත් කරගැනීමට යොදාගෙන ඇති බව දැක්වීම අවශ්‍ය වේ.

(iii) සමාජ යථාර්ථය

මිනිසුන් අතර ඇති භේදය ජාති ආගම් වශයෙන් ඇති බව අවශ්‍ය නොවන බව.
වෙන්ව සිටීමට ඇති සියලු බාධක ඉවත් කළ යුතු බව.
බැඳ ඇති විලංගුව පාමිණි සලඹ කොට
බේදය විනාශ වී සමඟිවීමේ අවශ්‍යතාව
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන .....
මේ සියල්ල යථාර්ථයක් ලෙස දක්වා තිබීම අවශ්‍ය වේ.

(iv) භාෂාව රසවත්ව යොදාගැනීම.

සරල බස - සෑම කවි පාදයකම උදාහරණ ඇත.
උතුර දකුණ ප්‍රදේශවල ව්‍යවහාර භාෂාව සරල ලෙස භාවිතය.
සමාන අසමානතා පෙන්වීම.

සංවාදශීලී බස - මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

සංකේත - තල්ගස්, පොල් ගස්, පවුරු, පාලම්
චිත්ත රූප මැවීම - ආදිය යොදාගෙන තිබිය යුතුය.

(v) කවියාගේ දෘෂ්ටිකෝණය උත්තම පුරුෂ වීම.
කවියේ සමීප බවක් සමඟ අත්දැකීම ප්‍රතිනිර්මාණය වී ඇත.
ඔහු උතුරේ ජීවත් වන බවක් පෙන්වා දී ඇත.
උතුරේ ජීවත්වීමට සිදු වූ විට ලැබූ අත්දැකීම්
තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතකම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිමද මිනිසා සතු දෙනෙත තෙත
රන්තරු රිදී තරු හවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස දහර හදේ

(මුළු ලකුණු 25)

*අනු අංක නැතිවද රසවින්දය ලියා ඇත්නම් ලකුණු දෙන්න.

**II කොටස**

(03) (i) පබාවතී දැක ගැනීමට. (ලකුණු 5)
(ii) පුෂ්ප පල්ලවයෙන් සඤ්චන්න වූ සපු දුනුකේ නා පනා සීනිද්ද බෝලිද්ද දෑ සමන් ආදී ගස් ලියද ගිරා බෝකල් ආදී පක්ෂීන්, පස් පියුමෙන් ගැවසීගත් පොකුණු. (ලකුණු 5)
(iv) ඇත්තලදී ඉලත්තියෙනුත් අස්සලදී අස්බෙටියෙනුත් මුන් විසින් ගැසීම, ඇතුගේ පශ්චිමාසනයෙහි ද මා වෙහෙස වීම. (ලකුණු 5)
(v) චිත්තරූප මවන බස - කුස රජු නෙළුම් මලකින් මූණ වසාගෙන සිටීම.
සංවාද - මම කුස රජය. යක්ෂයෙක් මා අල්ලා ගතැයි.
අතීත ආවර්ජනා මඟින් සරලව කතාව අවබෝධය.

නැතහොත්,

(i) ගස් කැපීම නිසා මුකලාන කන්තාර ගමක් බවට පත්වන ආකාරය උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් දැක්වීම. සිදුවීම් ලිවීම මඟින් අත්දැකීම ප්‍රකාශ වේ. (ලකුණු 5)
(ii) රෑ නින්දෙ දීම ගස් කපන ශබ්දය සමඟ ඇතිවූ වේදනාවට කඳුලක් වැටීම. (ලකුණු 5)
(iii) මූකලානේ ගස් කැපීම නිසා කාන්තාරය තවත් වැඩිවීම මෙයින් කියැවේ. (ලකුණු 5)
(iv) ව්‍යංග්‍යාර්ථ - මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුනේ
දෙවියන්ගේ මල්ලිලාට දෙවියොම රැවටෙන්නේ

උත්ප්‍රේක්ෂාලංකාර - යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
පාර උනත් හිරිහැර නෑ ඔහේ නිදියනවා
පොරව කියත කලුවරේම පණ ආවා ලෙසිනේ
සමාජ යථාර්ථයක් ලෙස මේ සිදුවීම සත්‍යයක් ආකාරයෙන් පෙන්වීම.
පැලේ වහල ඇද හැලිලා මාසයක්ම වෙනවා......
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා.....
ආදිය දක්වා ගස් විශාල වශයෙන් කැපීම ගැන දඬුවමක් නැති බව පෙන්වාදීම.
. (ලකුණු 5)
(මුළු ලකුණු 25)

**III කොටස**

04. ධර්මසේන හිමියන්ගේ කතා කීමේ කලාව සාහිත්‍යය වශයෙන් අපූරු බවක් ගෙනදීම.

<u>උපමා</u> - උන් කියාලූ බස නන්ද කුමරු සිත දිවුල්ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ.....
මඟුලෙහි හෙලාලූ කප උගුළුවන්නට බැරියා සේ.

<u>යෙදුම්</u> - වොටුනු මඟුලත් ගෙවදනා මඟුලත් විවාහ මඟුලත් තුන එක අවධියට පැමිණි කල්හි නිවන් මඟුල උතුම් බැවින්.

<u>චිත්තරූප මැවීම්</u> - අතුරු මග නවදැලි සේසත් මවාලා ඒ සෙනේ දා ගිය කණුවක දාවක ගැසී ගිය වැදිරිමැල්ලක මවාලා.
ආදිය මඟින් සාහිත්‍ය රසයක් දනවන අයුරු පෙන්වා එමඟින් දහම් පණිවුඩය ලබාදීම දැක්වීම.

05. ඉයෝනාගේ කරත්ත ගමන - කුළියට යන මිනිසුන් ඔහුගේ දුක ගණන් නොගැනීම.
මගේ පුතා මේ සුමානෙ මැරුණා . හ්ම් මොනවා වෙලාද.......
කැගසමින් පාරේ යාම. ඔහුට සිනාසීම.
ඉහි... ඉහි.... ඉයෝනා විරිත්තයි.
මගේ පුතා මළේ ...... මේ සුමානෙ
අපි කවුරුත් මැරෙනවා.......
ඇ මිනිහො උඹ කසාද බැඳලද?
මම? ඉහි... ඉහි... මට දැන් ඇත්තේ මගේ ගැනිත් තෙත පොළවත් විතරයි......
ඔහුගේ කතාව කිසිවකු ඇහුම්කන් නොදෙයි.
අවසානයේ කුඩා අශ්වයා පිදුරු හපයි..... ඇහුම්කන් දෙයි. හුස්ම හෙළයි.....
ඔහු කුඩා අශ්වයාටමුළු කතාවම කියයි.

06. <u>සංවාද බස</u> - එසඳ ඔබේ සාද තෙපුල් නෑසේ මට....
ඔබ අසලින් බැහැරට යම් කුමටද ඔබගේ අවසර......

<u>ව්‍යංග්‍යාර්ථ බස</u> - බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬමිස....
මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයාදී රකිමින්
ඒ මත නිදිනා ගලසේ මා අබියස නිහඬය ඔබ.

<u>උත්ප්‍රේක්ෂාලංකාර</u> - බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබි එබී බලයි.
නැතියෙන් ඔබෙ වත හසරැළි මදෙස බලා සිනා නඟයි.
සරල බස - ඕනෑම උදාහරණ පද පේළියක් ගත හැක.

<u>සංකේත</u> - සේයා රූ, මේසය මත හිඳිනා ගල, විදුලි පංකාව.

07. සිරිසේන් සිය ළමා කාලය උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයකින් නවකතාවක් ලෙස ඉදිරිපත් කිරීම.
පාසල් කාලය, පුංචි අම්මාගේ විවාහ උත්සවය, මාමලා සමඟ ඇති අත්දැකීම්.
කමත, පිංකම් පොළ, පෙරහැර ආදී ස්ථාන ඇසුරෙන්.